# කැලණිය විශ්වවිද්‍යාලය
## සමාජීය විද්‍යා පීඨය

## භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය මගින් මෙහෙයවන
## භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2022

උක්ත පාඨමාලාව සඳහා මතු දක්වෙන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර 2022 පෙබරවාරි 28 දක්වා භාරගනු ලැබේ.

**සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් තුනකින් සමත් වීම

හෝ

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව, විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් සමත්වීම සහ භූගෝලීය තොරතුරු පද්ධති ක්ෂේත්‍රයකට අදාළ වසර දෙකක වෘත්තිමය පළපුරුද්ද ලබා තිබීම

හෝ

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් හයකින් සමත්වීම සහ භූගෝලීය තොරතුරු පද්ධති ක්ෂේත්‍රයකට අදාළ වසර හතරක වෘත්තිමය පළපුරුද්ද ලබා තිබීම

හෝ

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගනු ලබන අධ්‍යාපන හෝ වෘත්තිමය සුදුසුකම් ලබා තිබීම

සහ

මූලික පරිගණක සාක්ෂරතාවය තිබීම

**තෝරා ගැනීමේ පිළිවෙළ**

සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, ඉන් සමත්වන අය පමණක් පාඨමාලාවට බඳවා ගනු ඇත.

මෙම පාඨමාලාව රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන්හි සේවයේ නියුතු පිරිස්වලට මෙන්ම භූගෝලීය තොරතුරු පද්ධති ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය කිරීමට කැමැත්තක් දක්වන සියලු දෙනා වෙනුවෙන් සැළසුම් කර ඇත.

**පාඨමාලා කාලය :**

එක් අධ්‍යයන වර්ෂයකි. (අර්ධ වාර්ෂික දෙකකින් සමන්විත වේ) දේශන සහ ප්‍රායෝගික පන්ති සෑම ඉරිදා දිනකම පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා පැවැත් වේ.

**මාධ්‍ය :** ඉංග්‍රීසි සහ සිංහල

පාඨමාලා ගාස්තු : රුපියල් 65,000 (සියලු ගාස්තු ඇතුළත්ව වාරික දෙකකින් ගෙවිය හැකිය)

**අයදුම්පත් :**

කැලණිය මහජන බැංකු ශාඛාවේ 055-100130667553 දරන කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැර වන සේ කැලණිය මහජන බැංකු ශාඛාවට රු. 750.00 ක අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබාගත් බැංකු රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පාඨමාලා අයදුම්පත්‍රය සහ විස්තර පත්‍රිකාව ලබාගත හැකිය.

http://ss.kln.ac.lk/depts/geography/ යන භූගෝලවිද්‍යා අධ්‍යයන අංශයේ වෙබ් පිටුවෙන් ද අයදුම්පත්‍රය ලබාගත හැකිය. එසේ ලබාගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කර අදාළ බැංකු රිසිට්පත සමග අධ්‍යයන අංශය වෙත සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පැමිණ භාර දීම හෝ තැපැලෙන් එවිය හැකිය.

අයදුම්පත් තැපැලෙන් ඉල්ලුම් කරන්නේ නම්, ඉල්ලුම් කරන කවරයේ වම්පස ඉහළ භූගෝලීය තොරතුරු පද්ධති ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතු අතර, අදාළ බැංකු රිසිට්පත සමග ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ලියූ රු. 15.00 ක් වටිනා මුද්දරයක් ඇලවූ 9"X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් පහත දැක්වෙන ලිපිනයට යොමු කිරීමෙන් ද අයදුම්පත් ලබාගත හැකිය.

අයදුම්පත් 2022.01.25 දින සිට නිකුත් කරනු ලැබේ.
(දෙපාර්තමේන්තු වෙබ් පිටුව තුළින් 2022.01.25 දින සිට අයදුම්පත් ලබාගත හැකිය.)

**විමසීම් / අයදුම්පත් එවිය යුතු ලිපිනය**

**සම්බන්ධීකාරක**
**භූගෝලීය තොරතුරු පද්ධති ඩිප්ලෝමා පාඨමාලාව,**
**භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**
**දුරකථන : 0719936119 / 0112903925 / 0702558912 / 0112903927 / 0715524646 / 0112903916**

**ලේඛකාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය,**
**2022.01.28**